# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 06

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

OCTOBER 10, 2009 ඔක්තෝබර් මාසය (බුද්ධ වර්ෂ 2553 වප් මාසය)    http://www.lankaheritage.com/lankaviththi/




නෙක් දුක, කඳුළ, මරණය තුළ සිටි සිරවී
නික් මී එයින් යළි පණ ලත් සුදු පරෙවී
දැක් මෙන් සතුට සැනසුම ලැබ සැක දුරැවී
ලක් මව අවදි වුණි පෙරදිග පැහැ බරවී

එනමුදු ලත් ජයක් වෙද දිවි දී නොයෙක
අමතක වී රට ම සිහිමඳ වූ ලෙසක
හැසිරෙනු දැක පරෙවි ඉගිලුණ හොත් දිනක
යළි එනු නොමැත ඔහු නොපෙනී යනු මිසක

Precious white dove that had been lost is back in hand
At the cost of thousands of lives lost in the battle-field
But seeing a forgetful uncaring nation groping in the dark
Will the dove soon take flight never to come back !

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# මේ කොහි යන්නේ....?

♦ **සංජය විමලරත්න විසිනි**

**කා**ලයක් තිස්සේ රටට වින කළ කොටි ත්‍රස්තයින් විනාශකර ලද විජයග්‍රහණයෙන් පසු මේ ගතවන්නේ පස්වන මාසයයි. රජය ඇතුළු මුළු රටම ඒ ජය ගැන සැණකෙළි පැවැත්වූ අතර අනෙක් අතින් එයට පසු දෙතුන් මසක් තුරාම කොටින් පරාජය කිරීම නොරිස්සූ බටහිර බලවේග අපට එදිරිව අවි අමෝරා ගත් ආකාරයද, ඒ ප්‍රයත්න ව්‍යවර්ථ කරලීම සඳහා රටේ ජනතාවද, දේශප්‍රේමී බලවේගද රජය සමග එකමුතුව පෙළගැසී සිටීමද, රජය ඒවාට එදිරිව කටයුතුවල යෙදී සිටින ආකාරයද සැනසුම් සහගතය. විදේශ සම්බන්ධතා පෙරමුණේ රජය සතුරන් හා මිතුරන් නිවැරදිව හඳුනාගෙන නිවැරදි ප්‍රතිපත්ති යක් ගෙනයෑම දේශප්‍රේමී ජනතාව සමග එකතුවී අගය කරමු.

මෙසේම දශක කීපයක් තුළ අතපසුවී තිබුණු රටේ ඉදිරි ගමනට අවශ්‍ය යම් යම් සංවර්ධන අංශවල යටිතල පහසුකම් තුළ ව්‍යුහමය සංස්කරණද යුහුසුළුව ගෙන යනු පෙනේ. විශේෂයෙන් මහා මාර්ග, දුම්රිය මාර්ග ආදිය නවීකරණය කිරීමද, විදුලිබල නිශ්පාදන අංශවලින් ද හම්බන්තොට ප්‍රධාන රට වටාම ලොකු කුඩා වරායවල් ගොඩනැගීම සහ දියුණු කරලීම ආදීවූ අංශ කීපයක කටයුතු චීනය ඉන්දියාව වැනි මිත්‍ර රටවල් සමග හවුල් වී කටයුතු අරඹනු පෙනීම සතුටට කරුණකි. කලකට පෙර කළ ආකාරයට බටහිර රටවලින් මේවා ගැන විශේෂඥ උපදෙස් බලා නොසිට අපේම ඉන්ජිනේරුවන් කාර්මික යින්ගේ දක්ෂතා භාවිතයට ගනිමින් කටයුතු යොදා තිබේ. නමුත් මේවා ගැන ජනතාව දැනුම්වත් කිරීමට කෙරෙන කටයුතු නම් ප්‍රමාණවත් නැත. රජයට අහිතවත් මාධ්‍යකාරයින් කරන්නේ රජයේ සංවර්ධන වැඩ පිළිවෙළ විවේචනය කරමින් ලිපි පළකර ජනතාවගේ මොළ හැකිතරම් අවුල් කිරීමය. මොවුන් පාලනය කරන්නට ප්‍රයත්න දරමින් කාලය නාස්ති කිරීම වෙනුවට රජය කළ යුත්තේ මේ සංවර්ධනයන් ගැන වගකිවයුතු අකාර යෙන් ජනතාවට දැනගැනීමට සැළැස්වීම ය. අපේ ජනතාව දේවල් තෝරා බේරා ගෙන කටයුතු කිරීමට හොඳින් දනිති. ඒ බව පසුගිය ත්‍රස්ත සමයේ **NGO** ගැති ඇතැම් මාධ්‍යකාරයින් පුවත් විකෘතිකර පළකළ අවස්ථාවන්හි ජනතාව නැණ නුවණින් කටයුතු කළ ආකාරය ම පෙන්වා දෙයි.

දීර්ඝ කාලයක් තිස්සේ ත්‍රස්ත පීඩනය නිසා මුළු රටම ආර්ථිකය ඇතුළු විවිධ පීඩනයන්ට භාජනය වී තිබිණ. එය ජනතාවගේ එදිනෙදා ජීවිතයට බෙහෙවින් බලපෑය. දැන් ත්‍රස්තවාදය විනාශ කරලූ පසු එම පීඩනයන්ගෙන් තරමක් හෝ කෙමෙන් මිදීමේ බලාපොරොත්තු කොයි කාගේත් සිත් තුළ තිබේ. නමුත් හාර පස් මාසයක් වැනි කෙටි කාලයක් තුළ ආශ්චර්යයන් කළ හැකියයි සිතන්නට තරම් ජනතාව මෝඩ නැත. එහෙත් එදිනෙදා ජීවිතයට බලපාන වැදගත් අංශ කීපයකින් හෝ යම් ඉදිරි පියවර ගැනීමට කටයුතු නොවලහා සිදුවන බවට අදාල අමාත්‍යංශ, ඇමතිවරුන් සහ නිලධාරීන් ක්‍රියාකාරී වන්නේ නම් ජනතාවට එය යම් අස්වැසිල්ලක් වනවා ඇත. ජනතාව ඉමහත් කලකිරීමට ලක්කරවන කාරණා කටයුතු රජය තුළින්ම හිස ඔසවන බව දැන් පෙනෙන්නට තිබෙන නිසා ඒ ගැන රජයද ජනතාවද දැනුම්වත් කිරීමටත් රටක් ලෙස දියුණුවට යාමට නම් කුමන අංශ දියුණු කළ යුතුද යන්නත් මඳ වශයෙන් හෝ දැක්වීමත් මේ ලිපියේ අදහසයි.

## අධ්‍යාපනය

මෙය අප රටේ සෑම නිවසකටම, පවුලකටම එදිනෙදා බලපාන වැදගත් අංශයකි. කියවීමට ලිවීමට දත් බව හෙවත් සාක්ෂරතාවෙන් (**Literacy**) මුළු ආසියාවේම ඉහළ තැනක සිටින ජනතාවක් වන අප ජනයා අධ්‍යාපනය සැමදාම අගය කළහ.

1940 ගණන් වල සිටම අප රටේ නිදහස් අධ්‍යාපනය තිබිණ. 1950 1960 ගණන්වල ව්‍යාප්ත වූ අධ්‍යාපන ක්‍රමය හැට හැත්තෑ ගණන් වනවිට ඉතා දියුණු මට්ටමක පැවතිණ. එකල තිබුණු මධ්‍ය මහා විද්‍යාල, මහා විද්‍යාල ආදියද ඒවායින් ඉගෙන රටේ ඉහළම මට්ටම් වලට ගිය ඒවායේ ශිෂ්‍යයින් එම දියුණුවට සාක්ෂිය. නමුත් 1980 90 ගණන් වල සිට අපේ අධ්‍යාපනය පිරිහෙන්නටත් ගරා වැටෙන්නටත් විය. එය ඒකාලයේ සිට පැවති ත්‍රස්තවාදයේ බලපෑම් වල ප්‍රථිපලයක් නොවේ. අධිරාජ්‍ය වාදී බ්‍රිතාන්‍ය යුගයේ අධ්‍යාපන ආකෘති මත සැකසුණ අප අධ්‍යාපන ක්‍රමය නවීකරණය නොවිණ. එසේම බටහිර ආකෘතියද අන්තර් ජාතික මූල්‍ය අරමුදල **IMF** ද වැනි බටහිර උපදෙස් අනුව කටයුතු සිදුවීම නිසාත් පැවති රජයන්හි අධ්‍යාපන ඇමති මට්ටමේ සිට පැවති උදාසීන භාවය ආදී සාධක රාශියක් මේ පිරිහීම් වලට හේතූන් වූහ. නිදහස් අධ්‍යාපනයට වෙන්වන මුදලින් වැඩි කොටස කවදත් භුක්ති වින්ද නාගරික මධ්‍යම සහ ඉහළ පන්තියට සීමාවූ ලොකු පාසැල් එසේ පිරිහීමට පත්වී නැත. ගම්බදට සහ නාගරික දුප්පත් පන්තියට සීමාවූ පාසැල් පමණක් ඉතා අබලන් තත්වයේය. මධ්‍ය මහා විද්‍යාල සහ මහා විද්‍යාල පරණ වලව් මෙන් අද ගරා වැටෙමින් පවතී. කුඩා පාසැල් ගැන කීමට අවශ්‍ය නැත.

උසස් අධ්‍යාපනයේ තත්වයද මෙයට නොදෙවෙනිය. බ්‍රිතාන්‍ය ආකෘතිය මත ආරම්භ වූ විශ්ව විද්‍යාල අධ්‍යාපනයද ක්‍රමයෙන් ඉල්ලුම වැඩිවෙත්ම ව්‍යාප්ත විය. වැඩි වැඩියෙන් උපාධි ධාරීන් පිට කළද ඒ බොහොමයක් කලා අංශ වලිනි. විශ්ව විද්‍යාලවල සමහර ආචාර්ය වරුන්ගේ උනන්දුව නිසා යම් යම් නවීකරණයන් වී නව අංශවලට නැඹුරුවීම් තිබුණත්, රටේ නව අවශ්‍යතාවට සරිලන පිරිස් අද විශ්වවිද්‍යාල පද්ධති යෙන් බිහිනොවෙති. අන්තිමට රටේ දක්ෂතම තරුණ පෙළ අතරමං කරන ක්‍රමයක් බවට අද මෙය පත්ව ඇත.

රටේ අවශ්‍යතාවට සරිලන එහි සංවධනයට සහභාගිවීමට නිපුණත්වය ලද පිරිස් බිහිකර වීම උසස් අධ්‍යාපනයෙන් ඉටු විය යුතු දෙයකි. එහෙත් මෑත අතීතයේ සිට මේ දක්වා රට කරවන කිසිවෙකු ඒ ගැන සොයා බැලුවේද? ළඟදී යූඇන්පී මන්ත්‍රිවරයෙකු යෝජනා කළා සේ රටේ උසස් අධ්‍යාපනය දියුණු කිරීමට පෞද්ගලික විශ්ව විද්‍යාල ඇරඹීම විසඳුම නොවේ. එවිට එය දැන් ඇති ඉන්ටනැෂනල් පාසැල් වලින් සිදුවන දේම ඉහළ මට්ටමකින් සිදුවෙනවා ඇත. එය රටේ ජනතාව සූරාගෙන කෑමට බලා ඉන්නා තවත් පිරිසකට බිස්නස් මාර්ගයක් සාදා දීමය.

මුළු රටේම සමස්ථ අධ්‍යාපන ක්‍රමයේ වෙනස් වීමක් අත්‍යාවශ්‍ය වී බොහෝ කලක් ගතවී ඇත. මෙය අධ්‍යාපන ක්ෂේත්‍රයේ යල් පැනගිය අදහස් මත කළ නොහැකි ය.


**4 වන පිටුව බලන්න**





ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න




විස්තර
පිටු අංක
3